# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.elections.gov.lk* *e-mail : info@elections.gov.lk*


මගේ අංකය : TR/PE/01//2020 ඔබේ අංකය : දිනය : 2020.06.22
எனது இல. உமது இல. திகதி

**චක්‍රලේඛ අංක PE/2020/TR-06**

**සියළුම තේරීම්භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**ඡන්ද පොළ ප්‍රවාහන පහසුකම් සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීම.**

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී අවශ්‍යතාව අනුව ඡන්ද පොළ කාර්ය මණ්ඩලය, ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන පහසුකම් සළසා ගැනීම පිණිස ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ යොදා ගැනීමට හැකියාව ඇත.

02. මේ සඳහා බස්රථ ලබාදිය හැකි මිළ ගණන්, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) විසින් මා වෙත දන්වා ඇති අතර, එය පහත පරිදි වේ. (අදාළ ලිපියේ පිටපතක් ද අමුණා ඇත.) ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඩිපෝ කළමනාකරුවන් සමග සාකච්ඡා කර ඔබට අවශ්‍ය බස්රථ ප්‍රමාණය කල්වේලා ඇතිව වෙන්කරවා ගන්න.

| විස්තරය | එක් දිනක් තුලදී පැය 12 අඩු කාලය සඳහා මුදා හරින බස්රථ සඳහා ගාස්තුව (රු) | එක් දිනක් තුලදී පැය 12 වැඩි කාලය සඳහා මුදා හරින බස්රථ සඳහා ගාස්තුව (රු) |
|---|---|---|
| ආසන 42 හෝ ඊට වැඩි බස් රථ සඳහා | රු. 13,500.00 | රු. 15,000.00 |
| ආසන 32 හෝ ඊට අඩු බස්රථ සඳහා | රු. 11,000.00 | රු. 13,500.00 |
| ධාවනය කළ හැකි උපරිම කි.මී.ගණන | 100 | 125 |
| උපරිම කි.මී.ගණන ඉක්මවූ විට කි.මී.1 ක් සඳහා අය කිරීම | රු. 80.00 | රු. 80.00 |
| පැය 12 ක කාලයක් ඉක්මවූ විට පැයකට ගාස්තුව (උපරිම පැය 6 ක් දක්වා පමණි) | - | රු. 400.00 |

03. මේ අනුව ඔබ විසින් යොදා ගැනීමට අපේක්ෂිත ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ ප්‍රමාණය කොතෙක් ද යන්න, අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ද ලිඛිතව දන්වන්නේ නම් මැනවි. ඡන්ද විමසීම අවසන්වීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ සඳහන් ගාස්තු ප්‍රමාණයන් යටතේ ඔබ විසින් ලබාගත් බස්රථ සඳහා ගෙවීම් කිරීමට ද කරුණාකර කටයුතු කරන්න.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

**පිටපත්** : 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) – (ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය) – මේ පිළිබඳව සියළුම දිස්ත්‍රික්කයන්හි ඩිපෝ කළමණාකරුවන් දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.
2. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව.
3. විගණකාධිපති
4. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
5. ප්‍රධාන මූල්‍ය නිලධාරී
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක
7. ගණකාධිකාරී (ගෙවීම්)


**සභාපති**
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல்: 011-2868445
*e-mail :chairman@elections.gov.lk*

**සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)**
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி:011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@elections.gov.lk*

**පරිපාලන නිලධාරී**
நிருவாகஅலுவலர்
දුරකථන/தொலைபேசி: 011-3083371
ෆැක්ස්/தொலைநகல் :011-3083371
*e-mail : info@elections.gov.lk*